

Chickenpox

පැපොල රෝගය

වෛද්‍ය හර්ෂ අලුත්ගේ
Dr Harsha Aluthge
MBBS, FRACGP, DFM RCGP(UK)
General Practitioner
Greenvale Medical Centre

පැපොල රෝගය යනු Varicella Zoster නැමැති වෛරසයක් මගින් ආසාදනය වන ඉතා ඉක්මනින් අන් අයට බෝවන රෝගී තත්වයකි.

රෝගය වඩාත් සුලභ වන්නේ ශීත ඍතුවේ හා වසන්ත ඍතුවේ මල් කාලයේදීය. (Winter and Spring Seasons)

බොහෝ රෝගීන්ගේ රෝගී තත්වය කිසිදු අතුරු ප්‍රතිවිපාකයකින් තොරව ඉබේ සුවවේ. නමුත් 1% පමණ රෝගීන්ට සංකූලතා ඇතිවිය හැක.

බොහෝවිට කුඩා ළමුන්ට රෝගය වැළඳෙන අතර වැඩිහිටි අයට රෝගය වැළඳුන විට තරමක තදබල ගතියක් පෙන්නුම් කරයි.

එන්නත් කිරීම (Vaccination) රෝගී තත්වය වළක්වා ගැනීමේ හොඳම ක්‍රමයයි.

පැපොල රෝගයේ රෝග ලක්ෂණ මොනවාද?

සාමාන්‍ය උණ
ශරීරයේ දුර්වලතාව/ තෙහෙට්ටු ගතිය
ශරීරයේ බිබිළි ඇතිවීම. මුලින්ම blisters නමැති ඔළුව, මුහුණ හා අත්පා වලට පැතිරේ.
මෙම බිබිළි පුපුරා ගොස් කලු පැහැ ගැන්වීම (Crusting) දින 5ක් පමණ ගතවන විට සිදුවේ.
මෙම කැළැල් මාස කිහිපයක් යනතුරු පැවතිය හැක.

රෝගියෙකුට නිරාවරණය වී දින 14 - 16 පමණ ගත වන විට (incubation period) රෝග ලක්ෂණ පෙන්නුම් කරයි. ශරීරයේ බිබිළි ඇතිවිටම දින කිහිපයකට පෙර උණ, හිසරදය, තෙහෙට්ටු ගතිය වැනි රෝග ලක්ෂණ පෙන්නුම් කරයි.

රෝගයේ අතුරු ප්‍රතිවිපාක (Complication)

- ශරීරයේ කැළැල් ඇතිවීම (Scaring)
- Cellulitis නමැති බැක්ටීරියා ආසාදනය
- Pneumonia රෝගී තත්වය
- Encephalitis නමැති මොළයේ ප්‍රදාහය
- Bleeding Disorders - ලේ වහනය
- කළාතුරකින් මරණය

ගර්භනී අවස්ථාවලදී රෝගය වැළඳුනු විට ඇතිවන ප්‍රතිවිපාක මොනවාද?

ගර්භනී මව්වරුන්ගෙන් වැඩිදෙනෙකු හට රෝගයට එරෙහිව ප්‍රතිශක්තිය පවතින නිසා බොහෝ විට රෝගයට ගොදුරු නොවේ.

නමුත් කළාතුරකින් හෝ රෝගය වැළඳුන හොත් මවට මෙන්ම කළලයට (උපදින දරුවාට) නොයෙක් සංකූලතා ඇතිවිය හැකිය.

ගර්භනී මවට නිව්මෝනියාව ඈබජැවය්කසඑසි හා ෆැව්එසඑසි නැමැති අක්මාවේ ප්‍රධාහය වැනි සංකූලතා ඇතිවිය හැකිය.

එසේම ගර්භනී කාලයේ මුල් සති 20 දී රෝගය වැළඳුනහොත් උපදින දරුවාට Congenital Varicello Syndrome නමැති රෝග තත්වය ඇතිවිය හැකිය.

ගර්භනී අවධියේ විවිධ කාළ වකවානු අනුව දරුවාට ඇතවිය හැකි සංකූලතා පහත පරිදි වේ.

පළමු සති 20 තුලදී - හමේ කැළැල් ඇතිවීම, ඇස්වල ආබාධ, කුඩා අත් පා වැනි අවයව ඇතිවීම, ස්නායු පද්ධතියේ දුර්වලතා.

සති 36 - 40 අතර - උපදින දරුවාට Chickenpox රෝගය ඇතිවිය හැකිය.

පැපොළ රෝගය පැතිරෙන්නේ කෙසේද ?

රෝගීයෙකු කහින විට හා කිවිසුම් යනවිට ශ්වසන පද්ධතියේ සෙම බිඳිති ආශ්වාස කිරීමෙන්

ශරීරයේ බිබිළිවල ස්‍රාවය සප්ර්ශ වූ විට (මෙය ඉතා දුලභය)

රෝගියෙකු ශරීරයේ බිබිළි මතුවීමට දින 2 - 5 අතර පෙර සිට බිබිළි වියළී යනතුරු (දින 5කට පසුව) දක්වා කාලය තුළ අන් අයට රෝගය පැතිරවීමේ හැකියාව පවතී.

අලුත උපන් දරුවන්, ගර්භනී මවුවරුන් හා ශරීරයේ ප්‍රතිශක්තිය අඩු උදවිය (උදා: පිළිකා රෝගීන්, HIV ආසාදිත රෝගීන් වැනි) රෝගයට ගොදුරුවීමේ වැඩි ඉඩකඩක් පවතී. එසේම, රෝගය වැළඳුන විට වඩාත් සංකූලතා පෙන්වයි.

රෝගය නිර්ණය කරගන්නේ කෙසේ ද?

සාමාන්‍යයෙන් රෝග ලක්ෂණ විශේෂයෙන් ආවේණික බිබිළි ඇතිවීම මගින් රෝගය නිර්ණය කරගනු ලැබේ. (Clinical Diagnosis)

තවද, බිබිළි වල ස්‍රාවය සාම්පලයක් ලබා ගෙන රසායනාගාරයට යවා පරීක්ෂා කිරීමෙන් ද රෝගය ඇති බවට තහවුරු කර ගත හැක.

පැපොළ රෝගය සඳහා ඇති ප්‍රතිකාර මොනව ද?

බොහෝවිට කිසිදු ප්‍රතිකාරයකින් තොරව රෝගය සුව වන අතර වඩා බරපතල රෝග ලක්ෂණ පෙන්වන විට Antivirus ප්‍රතිකාර මගින් රෝගය සුව කර ගතහැක.

බොහෝ විට රෝගය ආශ්‍රිත අනෙකුත් රෝග ලක්ෂණ වලට ප්‍රතිකාර කිරීමෙන් රෝගය ඔබු දිවීම වළක්වා ගත හැක.
විවේකීව සිටීම (Bed rest)
අමතර දියර පානය (Extra Fluid)
උණ සඳහා පැරසිටමෝල් වැනි ඖෂධ(Lukewarm Bath)
කැසීම අඩු කිරීම සඳහා Calmine Lotion වැනි ක්‍රීම් වර්ග

Chichenpox හා Shingles අතර ඇති සම්බන්ධය කුමක් ද?

Chickenpox රෝග වැළඳුනු අය සමහරකුගේ රෝගී වෛරසය අක්‍රිය මට්ටමකින් ස්නායු සෛල තුළ පැවතිය හැකිය. (Lies Dormant) එසේ පැවති පසුකාලීනය සක්‍රිය වී Shingles හෙවත් Iterpes Zoster නැමති රෝගී තත්ත්වය ඇතිවිය හැකිය. මෙහිදී ද බිබිළි ඇති විය හැකි අතර බොහෝ විට ශරීරයේ එක් පැත්තක පමණක් එම බිබිළි හා තුවාල ඇතිවිය හැකිය. Shingles වැළඳුනු රෝගියෙකුගේ බිබිළි වල ඇති සැරව ගෑවුනහොත් අන් අයට Chickepox ඇති විය හැකිය. NOt Shingles - විශේෂයෙන් කිසිදු පැපොළ නොවැළඳුනු හා එන්නත් නොලද අයහට

Chichenpox එන්නත් කිරීම

කුඩා කාලයේ දී (මාස 18 දී) එඑඍඈ නැමැති සරම්ප, කම්මුල්ගාය, හා රුබෙල්ලා රෝග වලට දෙන එන්නත හා කවලම් වූ තනි එන්නතක් මේ සඳහා ලබා දේ.

කුඩා කාලයේ දී එන්නත ලබා නොගත් අයට වැඩිහිටි අවධියේදී වුව ද තනි එන්නතක් ලෙස මෙය ලබා ගත හැක.

විශේෂයෙන් මෙහිදී සඳහන් කළ යුත්තේ ඔබ එන්නත ලබා ගත් විටදී වුවද ඉතා කළාතුරකින් රෝගය වැළඳීමේ අවධානමක් පවතී. නමුත් එන්නත් කල අයෙකුට රෝගය වැළඳුන හොත් එය ඉතා සුලු රෝග ලක්ෂණ වලට පමණක් බොහෝවිට සීමාවේ.